# හෙළ උරුමයේ සැබෑ මුහුණුවර

කණකොක් සුද පෙනෙන්නේ ඉගිලෙන විට දී යැයි කීවාක් මෙන් ජාතික හෙළ උරුමයේ සැබෑ මුහුණුවර පෙනෙන්නේ පාර්ලිමේන්තුවෙහි මන්ත්‍රී හාමුදුරුවරුන් කටයුතුකරන ආකාරයෙන් ය. හාමුදුරුවරු තමන්වහන්සේ පාර්ලිමේන්තු වැඩියේ අළුත් දේශපාලනයක් කිරීමට යැයි ද පාර්ලිමේන්තුව ශුද්ධකිරීමට යැයි ද එහි විනයක් ඇතිකිරීමට යැයි ද කීහ. එහෙත් අප මුල සිට ම කී පරිදි සිදු වී ඇත්තේ එහි අනෙක් පැත්ත ය. ජාතික හෙළ උරුමයට ඡන්දය දුන් ඇතැමුන් කුමක් කීවද අද පාර්ලිමේන්තුවෙහි කෙරෙන අළුත් දේශපාලනයක් නැත. අද සිදුවී ඇත්තේ හාමුදුරුවන් ද ජරා දේශපාලනයට වැටීම පමණ ය. උන්වහන්සේලා මේ ජරා දේශපාලනයෙහි විශාරදයන් බවට ඉතා කෙටි කාලයක දී පත්වී ඇතිවා පමණක් නොව ඇතැම් මන්ත්‍රී හාමුදුරුවරු ගිහි මන්ත්‍රීන් පරාජය කිරීමට ද සමත් වෙති. හාමුදුරුවරු පාර්ලිමේන්තුව ශුද්ධකරනු වෙනුවට එය තව තවත් අශුද්ධකරති. පාර්ලිමේන්තුවේ හාමුදුරුවරුන්ගේ විනය ගැන කතාකිරීමට තරම් දෙයක් ඉතිරි වී නැත.

අද මන්ත්‍රී හාමුදුරුවරුන්ගේ ආරක්ෂාවට ලියන්නේ මෙරට සමස්ත සිංහල බෞද්ධ සංස්කෘතියට ම පහර ගසන පත්තර කඩමාළු ය. මන්ත්‍රී හාමුදුරුවරුන්ට වැඩියෙන් ම ප්‍රචාරය ලබාදෙන්නේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකිරීම සඳහා ම පිහිටුවනු ලැබූ යහපත් සිරසක් නැති මාධ්‍ය වෙයි. සිංහල බෞද්ධයන් දූප්පත්කරන බුකිකාරයෝ බඩු උගස් ගන්නෝ රත්තරන් පොළු හොරෙන් රටට ගෙනැවිත් හසුවුවෝ අද මන්ත්‍රී හාමුදුරුවරුන් වෙනුවෙන් ජනමාධ්‍ය යොදාගනිති. විජාතික බලවේගවල අවශ්‍යතාව පරිදි හාමුදුරුවරුන් පාර්ලිමේන්තුවට යවනු ලැබුවේ භික්ෂුත්වය කෙළෙසීමට හා සිංහල බෞද්ධ සංස්කෘතිය හෑල්ලුවට හා විහිළුවට ලක්කිරීමට බව දැන්වත් පැහැදිලි විය යුතු ය. සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන අත්කරගැනීම සඳහා අවුරුදු විස්සකට ආසන්න කාලයක් ක්‍රියාත්මක වන අපට ඒ සංස්කෘතිය රැකගැනීම සඳහා අනගාරික ධර්මපාල තුමන් අනුව යමින් ඇතැම් විට අලජ්ජී භික්ෂුන් වහන්සේ විවේචනය කිරීමට සිදුවෙයි. සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකිරීමට ක්‍රියාකරන ජනමාධ්‍ය මන්ත්‍රී හාමුදුරුවන් වෙනුවෙන් පෙනී සිටියි. මේ පත්තර කඩමාල්ලකට ලියන එක් පඬියෙක් හාමුදුරුවරුන්ට මන්ත්‍රීවරුන්වීමට ඇති මානව අයිතිය ගැන කතාකිරීමට ආවේ ය. මානව අයිතිය යන්න ක්‍රිස්තියානි සංස්කෘතියේ බොරු කතාවක් බව බටහිර ක්‍රිස්තියානි රටවල කටයුතුකරන ආකාරයෙන් ම පෙනී යයි. ඒ කෙසේ වෙත් මේ පඬියාගේ බොරු මානවහිතවාදයට අනුව හාමුදුරුවන්ට විවාහවීමේ අයිතිය ද තිබිය යුතු ය.

වි ජ මු ලොකුබණ්ඩාර මහතා කතානායක බවට පත්කෙරුණේ ජාතික හෙළ උරුමයේ ඡන්ද දෙකක් හරහා ය. අපරැක්කේ පසද්සදානන්ද හිමියන් හා කතළුවේ රතනසීහ හිමියන් තමන්වහන්සේ ආණ්ඩුව සමග ඡන්දය දෙන බවට අතුරලියේ රතන හිමිට දන්වා තිබිය දී පළමු වටයේ දී ඊනියා ඡන්ද නිෂ්ක්‍රීයකිරීමට හෙළ උරුමයේ අනෙක් මන්ත්‍රී හාමුදුරුවරු පියවර නොගත්හ. අඩු තරමින් පසද්සදානන්ද හිමියන් හා රතනසීහ හිමියන් ඡන්දය දෙනවිට ද (දුන් පසුව ද) ජාතික හෙළ උරුමයේ අනෙක් මන්ත්‍රී හාමුදුරුවරු ඡන්ද නිෂ්ක්‍රීයකිරීමට කිසිම තැනක් නොගත්හ. එසේ නොකෙළේ ඉහත නම් සඳහන් හාමුදුරුවරු දෙනම ලොකුබණ්ඩාර මහතාට ඡන්දය දුන්නේ යැයි සිතූ බැවින් ද? එහි දී ඊනියා ඡන්ද නිෂ්ක්‍රිය නොකෙරුණේ ඒ හාමුදුරුවරුන් දෙනමගේ ඡන්දය ලොකුබණ්ඩාර මහතාට එරෙහිව ගිය ද ලොකුබණ්ඩාර මහතා දිනන බවට අනෙක් මනත්‍රී හාමුදුරුවන් ගණන් හදා තිබුණු බැවින් ය. එහෙත් නොසිතුවක් ම සිදුවිය. විරුද්ධ පක්ෂයේ එක් මන්ත්‍රීවරයකුගේ ඡන්දය නරක්වීම නිසා දෙපැත්තට ම ලැබුණු ඡන්ද සංඛ්‍යාව සමානවිය. ඒ මන්ත්‍රීවරයා ඊළඟ වටයේ දී නිවැරදි ව ඡන්දය පාවිච්චි කළහොත් ලොකුබණ්ඩාර මහතා පරදින බව දත් ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී හාමුදුරුවරු ගිහි නායකයන් ද දැනුවත් ව ඊනියා නිෂ්ක්‍රීය මෙහෙයුමට බටහ. ලොකුබණ්ඩාර මහතා කතානායක වූයේ එපරිද්දෙන් ය.

ජාතික හෙළ උරුමයේ අනුග්‍රාහකයන්ගේ ප්‍රතිපත්තිය එකට එක හෝ දෙකට දෙක හෝ යන ඇසට ඇසක් දතට දතක් වූ යුදෙව් බයිබලයේ ප්‍රතිපත්තිය වෙයි. ඒ යුදෙව් නිෂ්ක්‍රීය ප්‍රතිපත්තිය ඉදිරියට ගෙනයමින් රතනසීහ හිමියන් පැහැර ගැණුනු බව ද පැහැදිලි ය. රතනසීහ හිමියන් සන්ධානය විසින් පැහැරගනු ලැබුවේ යැයි කීවේ ජාතික හෙළ උරුමය ය. නිෂ්ක්‍රිය ප්‍රතිපත්තිය ඉදිරියට ගෙනගොස් ජාතික හෙළ උරුමය ද ඒ හිමියන් නැවත පැහැරගෙන ගොස් ඇති බව පැහැදිළි ය. නීතිය බුරුවකු යැයි කතාවක් තිබේ. නීතිඥයකුවන ලොකුබණ්ඩාර මහතා කරා රතනසීහ හිමියන්

© Prof. Nalin De Silva

කොළොන්නාවේ සුමංගල හිමියන් විසින් වැඩම කරනු ලැබූ විට නීතිය අනුව ඇසිය යුතු ප්‍රශ්න රතනසීහ හිමියන්ගෙන් අසා උන්වහන්සේගේ මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ ලේකම්වරිය වෙත ඉතා ඉක්මණින් ම ලැබෙන්නට සලස්වා ඇත. ඉතා කාර්යක්‍ෂම ලෙස කටයුතු කර ඇති ඇය ඒ ලිපිය අසුරු සැණින් මෙන් මැතිවරණ කොමසාරිස්වරයාට යවා ඇත. ඒ අනුව දයාරතන හිමි රතනසීහ හිමියන් වෙනුවට මන්ත්‍රී ධුරයට පත් කෙරෙන බව නිවේදනය කෙරිණි. එවිට දයාරතන හිමි පාර්ලිමේන්තුවේ දිවුරුම් දීම සම්බන්ධයෙන් අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කෙරිණි. එහි දී කරුණු විමසූ විනිසුරුතුමා ඒ හිමියන්ට ජුනි මස එකොළොස්වැනි දා තෙක් දිවුරුම්දීමට නොහැකිවන ලෙස වාරණ නියෝගයක් පැණවී ය. මේ නඩුවේ එක් වගඋත්තරකාරයකු වූ චම්පික රණවක වෙනුවෙන් නීතිඥ මනෝහර ද සිල්වා මහතා පෙනී සිටියේ ය. චම්පික රණවක ද එදින උසාවියේ පෙනී සිටි බව වාර්තා විය. ඒ කෙසේ වෙතත් ඔහුගේ නීතිඥයා ඔහු වෙනුවෙන් උසාවියේ කරුණු ඉදිරිපත් කෙළේ ය. දැන උගත් නීතිඥයකු වූ මනෝහර ද සිල්වා මහතා වාරණ නියෝගය පිළිබඳ ව චම්පික රණවක දැනුවත් නොකෙළේ යැයි කිසිසේත් ම සිතිය නො හැකි ය. චම්පික රණවක ජාතික හෙළ උරුමයේ ලේකම්වරයා ය. ඔහු වාරණ නියෝගය ගැන දැන සිටි බව පැහැදිලි ය. ජාතික හෙළ උරුමයේ ප්‍රධාන ලේකම්වරයා උඩුවේ ධම්මාලෝක හිමි ය.

පසුගිය දා කොළොන්නාවේ සුමංගල හිමියන් ඇතුළු අනෙක් මන්ත්‍රී හාමුදුරුවරු සමගින් දයාරතන හිමියන් දිවුරුම්දීමට පාර්ලිමේන්තුවට වැඩියේ මේ පසුබිමෙහි ය. කතානායකවරයා දයාරතන හිමියනට දිවුරුම්දීමට වඩින ලෙස ආරාධනාකර ඇත. කතානායකවරයා පවසන්නේ ඒ නිලයට උසාවියෙන් වාරණ නියෝගය දැනුම් දී නොතිබුණු බවත් නීතිඥයකු නම් ඒ දන්වා තිබූ බවත් ය. මේ නීතිඥයා කවුරුන්දැයි පැහැදිලි නැත. කතානායකවරයා නීතිය සම්බන්ධයෙන් ගත්කල මෙහි දී නිවැරදි දැයි නොදනිමි. එහෙත් කතානායකවරයා කෙසේවෙතත් ලොකුබණ්ඩාර මහතා නම් වාරණ නියෝගය ගැන නොදැන සිටින්නට හේතුවක් නැත. ලොකුබණ්ඩාර මහතා කතානායකවරයාට ඒ බව දන්වා උසාවියෙන් ඒ සම්බන්ධයෙන් විස්තර ඉල්ලා නොසිටියේ ඇයි ද යන්න නම් ප්‍රශ්නයකි. එසේ කිරීමට ඒ මහතා නීතියෙන් බැඳී නොසිටිනවා විය හැකි ය. එහෙත් පාර්ලිමේන්තුවේ කටයුතු අවුලකින් තොරව ගෙනයෑමට ලොකුබණ්ඩාර මහතාට පුරවැසියකු ලෙස හෝ අවශ්‍ය වී නම් එසේ කළ යුතුව තිබුණි. මින් ඉහත දී ද රතනසීහ හිමියන්ගේ ඉල්ලා අස්වීමේ ලිපිය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ද ඒ හිමියන් පැහැරගෙන යෑම සම්බන්ධයෙන් උසාවියේ නඩුවක් තිබූ බව ලොකුබණ්ඩාර මහතා නොදැන සිටියේ යැයි කිව නො හැකි ය.

ඒ ලොකුබණ්ඩාර මහතාගේ පැත්තෙන් ය. ඒ මහතා හොඳ බෞද්ධයකු වීමට හැකිවුවත් ගිහියෙක් වෙයි. එමෙන් ම දේශපාලනඥයෙක් වෙයි. එයටත් වඩා විජාතික බලවේගවල සෘජු ඒජන්තයා වූ එක්සත් ජාතික පක්‍ෂයේ සාමාජිකයෙක් වෙයි. ජාතික හෙළ උරුමයේ මන්ත්‍රී හාමුදුරුවරු ද අද වදාරන්නේ තමන්වහන්සේ වාරණ නියෝගය ගැන නොදැන සිටි බව ය. ජනමාධ්‍ය ඔසසේ ම ප්‍රසිද්ධ වූ මන්ත්‍රී හාමුදුරුවරුන්... ජනමාධ්‍ය ඔසසේ ම පුම්බනු ලැබූ මුන්වහන්සේ පුවත්පත් නොකියවන්නේ ද? තමන්වහන්සේ නිතර පෙනීසිටින රූපවාහිනී නාලිකා නො නරඹන්නේ ද? එයටත් වඩා ජාතික හෙළ උරුමයේ ලේකම් වූ ද නිතර ජනතාව දැනුවත් කරන්නේ යැයි ද කියන චම්පික රණවක  වාරණ නියෝගය ගැන මන්ත්‍රී හාමුදුරුවන් දැනුවත් නො කෙළේ ද? එසේ නොකෙළේ නම් ඔහු කර ඇත්තේ බරපතළ වරදකි. වාරණ නියෝගයක් තිබිය දී දයාරතන හිමියන් දිවුරුම්දීමට නොවැඩියේ නම් පාර්ලිමේන්තුවේ මේ කිසිම කලබලයක් නො සිදුවෙයි. එසේ නොවැඩියේ නම් දෙපැත්තේ ම මන්ත්‍රීවරුන්ගේ තල්ලුකිරීම්, පරුෂවචන කීම් මෙන් ම ඇතැමුන්ට අනුව මන්ත්‍රී හාමුදුරුවරුන් ද ඇතුළු මන්ත්‍රීවරුන්ගේ නොහොබිනා හැසිරීම් වළක්වාගත හැකිව තිබුණි. එලය නැතිකළ හැක්කේ හේතුව නැතිකිරීමෙන් බව අප හාමුදුරුවන් නොදන්නවා නො වෙයි. හාමුදුරුවරුන් පාර්ලිමේන්තු වැඩියේ මේ නොහොබිනා හැසිරීම් වැළැක්වීමට යැයි ද කියමින් ය. එහෙත් මේ හාමුදුරුවරු දැන් මන්ත්‍රීවරු ද වෙති. උන්වහන්සේලා හා ලොකුබණ්ඩාර මහතා අතර දැන් වෙනසක් නැත. සියල්ලෝම නොහොබිනා හැසිරීම් ඇතිකිරීම සඳහා හේතු නිරමාණය කරති. ජාතික හෙළ උරුමය එදා කීවේ ආණ්ඩුවේ යහපත් ක්‍රියාවලට සහාය දෙන බව ය. විජාතික බලවේග විසින් මෙහෙයවෙන ඒ පක්‍ෂය ඒ ජා පක්‍ෂයට විරුද්ධව නොයන බව අපි දැන සිටියෙමු. අද උන්වහන්සේලා ආණ්ඩුවට විරුද්ධව ඒ ජා පක්‍ෂය සමග ද කොටින් විසින් මෙහෙයවන දෙමළ මන්ත්‍රී සංධානය ද සමග ද එක් වී ඇත. එහි පුදුමයක් නැත. ඒ සියල්ලෝ ම බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ගේ සෘජු හෝ වක්‍ර හෝ නියෝජිතයෝ වෙති.

© Prof. Nalin De Silva